




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## විඳිම්

**එකල්හි ජීවිතය**
**තනිකඩ විය**
**නොකල්හි වීථි සැරුව ද**
**ලද පරාභවයක් නොවී ය!**

**රඟහලෙක - සිනමා හලෙක**
**පොත් සල්පිලෙක**
**හිත මිතුරු කවි - කිවිඳි ඇසුරෙක**
**වෙළී පැටලී ගෙවා කාලය...**
**ගෙදර යන විට රෑ බෝ විය**

**අපමණ දවස් විය**
**නිශා අසිරිය විඳිමින**
**පයින් ම ගෙදර ගිය!**

**රෑ බෝ වූ නමුත්**
**'දවස තවමත් තරුණ විය'**
**එකල්හී මට...**
**රැයක් යනු එක පොතක් විය**
**පොතක් යනු එක රැයක් විය!**
**එකල්හි ජීවිතය**
**තනිකඩ විය!**
**කාලයාගේ ඇවෑමෙන්**
**තනිකඩ දිවිය**
**'දෙකඩ' විය**
**බොහෝ දෑ සිදු විය**

**රැයක් යනු බිරිඳක් ය**
**දරුවන් ම දෙදෙනෙක් ය**
**දැන් ඉතින්...**
**පොතක් යනු...**
**සතියක් නැතිනම් දෙකක් ය**
**නැතොත් ඊටත් වැඩිය**
**කන්තෝරු මරුකතර**
**බලා යන - එන අතර**
**සරම් පොත් පිටු අතර**
**පෙර පුරුදු අත්නොහැර**

### පියන්කාරගේ බන්දුල ජයවීර

('යට කඩේ උඩ ගෙදර' කාව්‍ය සංග්‍රහය - 2014)

එකක් වෙනුවට තව එකක් ආදේශ වීම ජීවිතයේ ස්වාභාවය වේ. මුලින් තිබූ දෙය අහිමිවීමත් සමගම අලුතෙන් අත්පත් වන දේ තුළ ඔබට ලැබෙන්නේ වඩාත් යහපත් හෝ අයහපත් දෙයක් දැයි යන්න ඔබ පසුකරගෙන ආ හා පසුකරන් යන ජීවිතයටත් වඩා ඔබ ඒ දෙස බලන බැල්ම මත පදනම් වේ. පියන්කාරගේ බන්දුල විසින් රචිත උක්ත කවියත් ඔහුගේ ජීවිතය උදෙසා එකක් වෙනුවට තව එකක් ආදේශවීමක් පිළිබඳ කියැවේ.

කවිය ඇරඹෙන්නේ ඔහුගේ තනිකඩ ජීවිතය ගැන කිසියම් ඉංගිතයන් කිහිපයක් අප හමුවේ විද-ාරණය කරමිනි. කවිය දිග හැරෙන විලාසයෙන්ම ඒ අතීතයක කතාවක් බව කියැවේ. අතීතයේ හෝ වර්තමානයේ හෝ වේවා තනිකඩ ජීවිතය යනු කිසිම බරපතල කමක් නුහුලන ජීවිතයේ යම් යම් අර්ධයන්ගෙන් හොඳම අර්ධයක් යැයි මම විශ්-වාස කරමි. යුතුකම් හා වගකීම් වලින් තලා පෙලා දමන්නට පෙර මනුස්සයකු ගෙවන සැහැල්ලුම වකවානුවක අන්තිමම අදියරය තනිකඩ කාලය ලෙස නම් කළ හැක. අප කතකයා සිය කවියේ පළමු කොටසින්ම නොබියව කියන්නේ එවන් නිදහස්කාමී අතීතයක වෙලාවක් අවේලාවක් නොතකා කොතරම් වීථි සැරුවද ඔහුට වුණු විනාශයක් නැති බවයි. ඒ වීථි සැරීම කුමන අරමුණින් වූවද ඒ තුළ ජීවිතය වඩ වඩා පුළුල්ව විඳගන්න ඔහුට පුළුවන් වූ බව නොකියා කියැවේ. එවැනි හැසිරීමක් තුළ, නිදහසක් තුළ මිනිසකු වල් බිහිවේ යැයි කියන ඊනිය සුචරිතවාදී සමාජ තර්කනයන් එක එල්ලේ පසෙක ලා ඔහු කියන්නේ කිසිදු වියසනයක් සිදු නොවුණ බවකි. ඒ නිසාම ඒ තනිකඩ කාලය ඉතාමත් ආදරයෙන් ඔහුගේ මතක අවුළුවා ලයි.

කිසිදු බරක් පතලක් නැති එවන් තනිකඩ කාල වල, පාන්දරම නිවසින් එළියට බැස්සද අතරමග කරන්නට තිබුණු නොයෙක් දේ කිරීමෙන් අනතුරුව ගෙදර යද්දී රෑ බෝ වේය. ඒ කාලයට, නෘත්‍යාගාරවල වෘන්ද පසු පස ද, පුළුල් තිර මත සංචලනය වන චිත්‍රපට රූප රාමු පසු පස ද නොදුවන තරුණයකු සොයා ගැනීම උගහටය. හිත මිතුරු කවි කිවිඳියන් ඇසුරේ කල් මරමින් කතා දැල් වල පැටලෙමින් කාලය ගත කරන විට වේලාව ගත වනවා දැනුනේ නම් පුදුමයකි. ඒ සියල්ල හමාර වූ පසු නැවතත් නිවස බලා යද්දී නොදැනීම රෑ බෝ වී තිබීම මහා විශේෂ කාරණයක් ද නොවන්නේ, තනිකඩ ජීවිතය වඩ වඩාත් මිහිරට විඳින්න ඒ තනිකඩ බවම මාර්ගය පාදා දෙන බැවිනි.

නිශා සිරිය විඳිමින් වැනි වැනීම පයින්ම ගෙදර ගිය අපමණ දවස් තිබූ බව ඔහු අපට කියයි. ඒ තුළ කැටිව ඇත්තේ දුකකි. අතීතකාමී රිදවුමකි. ඒ පයින්ම යන්න වූ නිසාවත්, රෑ බෝ වී තිබීම නිසාවත් නොවන බව අපි සියල්ලෝම දන්නෙමු. ඒ නිදහස්කාමී අතීතයක් අහිමිව යාමේ දුක විනා අනෙකක් නොවේ. කොතරම් රෑ වුණද හිරු පෑව්වා සේම දවස ඉතා තරුණ වූ බව හෙතෙම කියයි. එක රැයකට එක පොත බැගින් කියවන්න පුළුවන් වූ බව කියයි. පොතක් යනු මිතුරන් රැසකි. රාත්‍රීන් රැසක් යනු මිතුරු සමූහයක් වන්නේ එවැනි රාත්‍රීන් දවසින් දවස ගෙවී යාමෙනි. එකින් එකට ඔහු අපට කියන්නේ ඔහු විඳි නිදහසේ විවිධ මුහුණු ගැනයි. නා නා විදියට ඔහු ඒ නිදහස භුක්ති විඳි ආකරය ගැනයි.

පුන පුනා ඔහු අපට මතක් කරදුන්, අතීතයේ ඒ සොඳුරු නිමේශයන්ට, එනම් ඒ තනිකඩ ජීවිතයට වැඩි ආයුෂ නොතිබුණ බව එක පාරටම ඔහු අපට කියයි. එය ක්ෂණික කම්පනයකි. මිනිසෙක් කාලාන්තරයක් තිස්සේ විඳි අපූර්වතම අත්දැකීම් සමුදායක් හිටි වනම නවතා දමන්නට වීම ඛේදවා-චකයක් වැනිය. ඔහු වඩාත් පෙම් කළ ඔහුගේ තනිකඩ දිවිය දෙපලු වී ඇත. මන්ද, බොහෝ දෑ සිදුවී අවසානයේ ස්ත්‍රී පුරුෂ ප්‍රේමය නම් උගුලේ පැටලී, යන එන මං නැතුව ඒ සොඳුරු තනිකඩ මොහොත විවාහය නම් ව්‍යසනයෙන් කෙළවර වූ නිසාවෙනි. මා මෙලෙස කියන්නේ, සමාජයෙන් මේ දිහා බලන්නට ඉල්ලා සිටින කෝණයෙන් නොබලා, කවියාගේ කම්පිත සිතට අනුගතවී මේ අවස්ථාව වටහා ගන්නට උත්සාහ කළොත්, ඔබටත් එය එසේම වැටහෙනු ඇතැයි උපකල්පනය කරමිනි. එවිට ඔබටත් කුටුම්භයෙන් මිදී මිහිරිම වූ තනිකඩ ජීවිතයක මතක පිරුණු අතීතයේ දුර ඈත ඉසව්වකට ගොස් මොහොතක් නතරව හිඳ ආ හැක.

එකල රාත්‍රියක් යනු පොතක් යැයි කී අප කවියා රාත්‍රියක් යනු බිරිඳක් යැයි මතුරන තැනට දැන් වැටී ඇත. මා මුලින්ම කියූ, එකක් වෙනුවට තව එකක් ජීවිතයකට ආදේශවීම මෙයයි. වඩා හොඳ අහිමි වූ දේද, නැත්නම් හිමි වූ දේ දැයි කිරා මැන බලා නිශ්චිත පිළිතුරක් දිය නොහැක. මන්ද ඒ ඒ සන්දර්භයට අනුව උච්චාවචනය වන, වෙනස්වනසුළු පිළතුරු මත ජීවිතය ඇදී යන බැවිනි. දැන් ඔහුට දරුවන්ම දෙදෙනෙකි; වගකීම් බහුල රැකියාවකි. නන්නත්තාර වෙමින් වීථියක් වීථියක් ගානේ නිශාචර වෙමින් කල් මැරිය නොහැක. ගෙදර ආ සැනින් පොතක් බදා ගෙන තමන්ගේ මනෝ ලෝකයක භාවමය ඉම් පෙදෙස් පීර පීරා තනිවම සැරිය නොහැක. බිරිඳ, දෙදරුන්, වගකීම්, යුතුකම් ඈ සියල්ල අතින් ඇද ඇද ඔහුව නවත්වයි. ඉන් පලා යා නොහැක. කළ හැකි එකම දේ ලෙස පෙනෙනුයේ අතීතකාමී මතක රළ පතර මත වරක් දෙවරක් කිමිදී උඩ මතුවීම පමණකිය.

දැන් ඔහුට පොතක් පතක් කියැවීමට ලැබෙන්නේ රැකියාවට යමින් එමින්ය; අතරමගය. රාත්‍රියක් පොතක් යැයි නම් කළ ඔහුම දැන් සතිය හෝ දෙසතිය හඳුන්වන්නේ පොතක් ලෙසිනි. ඔහුගේ තනිකඩ ජීවිතයේ තිබුණු බොහෝ විවේකීය හිස් අවකාශ අලුත් පවුල් ජීවිතය විසින් පුරවා ඇත්තේ ඒ ලෙසය. අර්ථ ගන්වා ඇත්තේ ඒ අයුරින්ය. එක්තරා අන්දමක වේදනා බර ස්වරයකින් මේ දේ කියා පෑවද එවන් රමණීය අතීතයක් ගැන ප්‍රේමනීය වෙමින් ලියා තිබුණද, බිරිඳ හා දෙදරුන් සමග ගෙවන ජීවිතය දෙස කිසිදු ආකරයක දොසක් අහිතක් හේ නොනගයි.

ඇත්ත ඇති සැටියෙන්ම දකිමින් අප සියලු දෙනාටම විඳින්නට සිදුවන පොදු ජීවනමය අත්දැකීමක් වඩාත් හාස්‍යමය ස්වරූපයකින් ගෙනහැර දක්වන්නට මොහුට හැකිවී තිබේ. මන්ද ඔහු තමාගේ ජීවිතයටත් තමා විඳි හා විඳිනු රිසි ජීවිතයටත් අවංකව මේ දේ ලියා ඇති නිසාවෙනි. මේ කවිය තුළ, ජීවිතය දෙස හෙලන ඒ අවංකකම හා එය බාහිර ලෝකයා වෙත සම්ප්‍රේෂණය කරන තානම තුළ අපටත් අපේ ජීවිත දෙස යළි හැරී බලා කිසියම් ජීවිතාවබෝධයක් දල්වාගන්නට මං පෙත් විවර කර දී ඇත.

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

**"සාහිත්‍ය සම්භාෂණ"**

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන **"සාහිත්‍ය සම්භාෂණ"**

**එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්**

දෙමසකට වරක් අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.

අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/

